**මාවතගම ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවානිමි කර්මාන්ත 16 ක වියදම් රු.4,607,251 ක් නැවත ණයහිමියෝ ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම 2018, 2019 වර්ෂයේ සිට පවතින ණයහිමියන් පිළිබඳව සොයා බලා පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.893,029 ක් වටිනා ගබඩා තොග ගිණුම්ගත කර නොතිබුණි. | උපලේඛනවල තොගය සෑදී ඇති ආකාරය අනුව රු.893,029 ක වෙනසක් පවතී. මේ පිළිබඳව කරුණු සොයා බලා ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් මෙය නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | ටෙන්ඩර් බදු කලින් ලැබීම් රු.135,843 ක් හා සේවක ඇප තැන්පත් රු.319,803 ක් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මීළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සභා සේවකයෙකුට ගෙවිය යුතු අතිකාල රු.7,962 ක් වුවත් එය රු. 79,624 ක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සේවකයෙකුට ගෙවන ලද අතිකාල ගෙවීමට රු.7,962 මුද්‍රණ දෝෂයකින් රු.79,621 ක් ලෙස සටහන් වීමෙන් වූ වරද නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කරගත යුතුය. |
| (ඉ) | තිබ්බටුලන්ද වත්ත ඉඩමේ වටිනාකම රු. 150,000 ක් වුවත් එය රු.15,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | තිබ්බටුලන්ද වත්ත ඉඩමේ වටිනාකම රු.15,000 ක් ලෙස සටහන් වී තිබුණේ මුද්‍රණ දෝෂයකින් වන අතර, එය 2023 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව තිබූ රු.50,000 ක් වටිනා රූඩ් 02 පර්චස් 10 ක ප්‍රමාණයක ඉඩමක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කර නොතිබූ රු.50,000 ක් වටිනා ඉඩමේ වටිනාකම මෙම වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | -එම- |
| (උ) | රු. 1,553,182 ක් වටිනා වැය විෂයයන් 45 කට අදාළ ණය හිමියෝ, ජාතිය ගොඩනැගීමේ බදු රු.61,746 ක් හා ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.84,548 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මුද්‍රණ දෝෂයකින් සටහන් නොවූ රු.1,553,182 ක් වටිනා ණයහිමියන් 2023 වසරේ අවසන් ගිණුම තුළින් නිවැරදි කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.534,510,700 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂයන් හා උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.33,722,746 ක වෙනසක් විය. | මුද්දර ගාස්තුවල මූල්‍ය ප්‍රකාශනය හා උපලේඛනය අතර වෙනස මුද්‍රණ දෝෂයක් බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා උපලේඛන සමාන විය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.49,201,526 ක් වූ ගිණුම් ශේෂ 05 ක් එම ශේෂ සැදුම්ලත් ආකාරය සනාථ කිරීමට අවශ්‍ය උපලේඛන, ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙම ශේෂයන් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වී පවතින අතර, ශේෂ සැදුම්ලත් ආකාරය පිළිබඳව ලේඛන අප සතුව නොමැති බව. | ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මු.රෙ. 177 | ශරීර සුවතා මධ්‍යස්ථානය විසින් රැස්කරනු ලබන මුදල් එම නිලධාරියා විසින් දීර්ඝ කාලයක් අතරදවා තබාගෙන තිබුණි. | එම නිලධාරියා මුදල් ඔහුගේ අත දීර්ඝ කාලයක් රඳවාගන්නා නිසා නැවත අප විසින් කාර්යාලයට මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා යවන ලදි. ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | ආදායම් රැස් කිරීමට බලය ලබා දී ඇති නිලධාරීන් පමණක් එම කටයුත්ත සිදුකළ යුතු අතර එකතු කරන ආදායම් කඩිනමින් බැංකුගත කළ යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ ii වගන්තිය | ටෙන්ඩර් මඟින් රු.1,500,000 ක එකවර අයකරන මුදලක් අයකර ලබාදී තිබූ කඩ කාමර 06ක් සඳහා තක්සේරුගත බදුකුලියක් අයකිරීම වෙනුවට මාසිකව රු.500 ක නාමික කුලියක් අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් එම නාමික කඩ කුලිය තක්සේරු කළ අතර, 2022 වර්ෂයේ තක්සේරුව සඳහා අවශ්‍ය ලිපිලේඛන යොමු කර ඇති බව. | තක්සේරුව කඩිනමින් සිදු කර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,000,841 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,592,419 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022<br>ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021<br>ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,110 | 5,130 | 3,947 | 6,541 | 5,560 | 4,782 | 4,049 | 7,044 |
| කුලී | 8,670 | 9,323 | 9,403 | 553 | 13,916 | 6,832 | 8,007 | 8,554 |
| බලපත්‍ර ගාස්තු | 600 | 217 | 217 | - | 401 | 217 | 217 | - |
| වෙනත් ආදායම් | 110,231 | 167,636 | 167,636 | 19,208 | 380,500 | 49,798 | 42,853 | 68,144 |
| එකතුව | 124,611 | 182,306 | 181,203 | 26,302 | 400,377 | 61,629 | 55,126 | 83,742 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල 4,708 න් රු.6,541,691 ක හිඟ වරිපනම් බදු ශේෂයන් පැවතුණි. | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 – 42 ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධි විධාන අනුව හිඟ ආදායම් අයකරගත යුතුය. |
| **(ආ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.656,138 ක හිඟ අක්කර බදු මුදලක් විය. | හිඟ අයකර ගැනීම සඳහා දැනටමත් ලිපි මඟින් දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හා වත්කම් බදු දීම් හිඟය රු.668,674 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර බස් නැවතුම්පල පළමු මහළ කඩ කාමර 05 ක් බදු දීමේදී ලබාගත යුතු එකවර මුදල වන රු.6,674,500 ක් අයවිය යුතුව පැවතුණි. | ඉතිරි කඩ කාමර 04 ට අදාළ හිඟ මුදල් ගෙවන ලෙසත් එසේ නොගෙවන්නේ නම් එම ටෙන්ඩරය අහෝසි කරන බවටත් ලිපි යවා ඇති බව. | අයකරගෙන නොමැති ඉතිරි හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මළ අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානය ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති අතර රු.600,000 ක් පමණ වැයකර මළ අපද්‍රව්‍ය දැමීමට සකස් කර ඇති Ramp එක ට්‍රැක්ටරයක් ඇතුළු කළ හැකි තත්ත්වයේ නොතිබුණි. | මෙම ඉඩමේ ඇති ඉඩකඩ ප්‍රමාණය සලකා අඩු පිරිවැයක් දරා මෙම Ramp එක ඉදිකර ඇති අතර, පවතින ගොඩනැගිලි නිසා කසළ ගොඩබෑමට යන මාර්ගයද අවහිර නොවන ලෙස මෙම Ramp එක ඉදි කිරීම සිදු විය. තවද ඒ අවට බොරළු පුරවා ට්‍රැක්ටරය ඇතුළු කළ හැකි පරිදි සකස් කර ඇති බව. | කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය. |
| (ii) | කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා භාවිතා කරන අක්කර 04 පර්චස් 90 ක වපසරියකින් යුත් ඩෙනවර් වත්ත ඉඩම 2023 මාර්තු 13 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඩෙනවර් වත්ත ඉඩම 2023 වසර වන විට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන රු.93,989 ක අත්තිකාරම් ශේෂ 09 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වසරේ සිට පැවතගෙන එන ශේෂයකි. ඒ සම්බන්ධව තොරතුරු සොයමින් පවතී. ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වරිපනම් බදු දේපල තක්සේරුව වසර 05 කට වරක් සිදු කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිදුකළ තක්සේරුව අනුව වරිපනම් බදු අයකර තිබුණි. මේ හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අනුකූලතා සහතික ලබාගත් දේපල 227 ට ආසන්න ප්‍රමාණයක් සඳහා වරිපනම් ආදායම් සභාවට අහිමි වී තිබුණි. | 2023 වර්ෂයේ දේපළ තක්සේරුවක් සිදු කරන බව අප වෙත ලිඛිතව දන්වා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය දේපළ ලැයිස්තුව අප විසින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති බව. | අලුතින් එකතුවන වරිපනම් දේපල තක්සේරු කර, ලේඛනයට ඇතුලත් කර වරිපනම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත වයඹ සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරගෙන ප්‍රාදේශීය සභාවල ආදායම් හා වියදම් වාර්තා කිරීම සඳහා CAT 2020 මෘදුකාංගයක් හඳුන්වා දී තිබුණි. මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීම සඳහා 2021 අගෝස්තු 26 දින ගිවිසුම්ගත වී තිබූ අතර මේ සඳහා ප්‍රාදේශීය සභාව විසින් රු.970,000 මුදලක් වැයකර තිබූ නමුත් මෘදුකාංගය මඟින් සිදුකරනු ලබන කාර්යයන් වසරක කාලයක් තුළ ආරම්භකර පවත්වාගෙන යාමට කටයුතු කරන බවට ගිවිසුමේ දක්වා ඇතත්, එම මෘදුකාංගය 2022 ජනවාරි වන විටත් නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ රු.400,000 ක ආධාර මුදලක් මාවතගම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් වයඹ සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඇත. ඉතිරි මුදල ගෙවීමට නියමිතව ඇත. 2022 ජනවාරි මස වන විට CAT 2020 ආරම්භ කිරීමට ප්‍රමාණවත් පරිගණක සහ පරිගණක දැනුම සහිත නිලධාරීන් නොසිටි නමුත් 2020 අගෝස්තු වසරක් සම්පූර්ණ වීමට ප්‍රථම ආරම්භ කරන ලදි. 2020 ජූලි මස CAT 2020 මෘදුකාංගය භාවිතයෙන් බිල් නිකුත් කිරීම ආරම්භ කර මේ වන විට අංශ 8 ක් ඔස්සේ ක්‍රියාත්මක කරමින් පවතින බව. | මෘදුකාංගයේ පවත්නා අඩුපාඩු මඟ හරවා, අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | සභාවේ කැබ් රථයට 2022 මැයි 09 දින සිදුවූ හානිය සම්බන්ධව 2022 මැයි 30 දිනැති අංක KRG/E/MPS/22/52 විගණන විමසුම මඟින් විමසීම් කර තිබූ අතර, 2022 නොවැම්බර් 05 විගණිත දින වන විටත් මෙම රථය අලුත්වැඩියා කර සභාව වෙත ලබා දී නොතිබුණි. | කැබ් රථයට සිදුවූ හානිය සම්බන්ධයෙන් මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිමය කටයුත්තක් පවතින බැවින් මසකට අධික කාලයක් මහේස්ත්‍රාත් අධිකරණයේ රථය ගාල්කර තිබුණ බැවින් අළුත්වැඩියා කටයුතු ප්‍රමාදව සිදු කිරීමට සිදු වූ බව. | වාහනයට සිදු වූ හානිය මඟින් සිදු වූ අලාභය ඊට වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | මාවතගම බස් නැවතුම්පල පළමු මහල කඩ කාමර 5 ක් 2022 මාර්තු 02 දින සභා තීරණයක් මත වාරික 24 කින් ගෙවීමේ පදනම මත බදු දී තිබුණි. එකවර කරනු ලබන මුදල වර්ෂ 02 කට ආසන්න කාලයක් කොටස් වශයෙන් අයකර ගැනීම නිසා එම කාලසීමාව සඳහා මාසික කුලී මුදල් සභාවට අහිමි වී තිබුණි. | වාරික 24 කින් ගෙවීමට සහන කාලයක් ලබාදුන්නද අදාල වාරික මුදල් නොගෙවූ අයගේ ටෙන්ඩරය අහෝසි කිරීමට සිදුවන බව දන්වා ඇත. 2023 වර්ෂයේ සිට කඩකුලී අය කිරීම සිදු කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු මහජන පුස්තකාලය අසල පර්චස් 40 ක පමණ වාණිජ වටිනාකමකින් යුත් භූමි භාගයක් පැවතුණද එය ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිතව තිබෙන බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය සිට බදු පදනම මත ටෙන්ඩර් කර ව්‍යාපාර කටයුතු සඳහා ලබාදී ඇති බව. | සභාව සතු දේපල තුළින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.10,100,000 ක් වටිනා වාහන 02 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අපහරණ කටයුතු සිදුකරමින් පවතින බව. | අපහරණ කටයුතු කඩිනම් කර අපහරණයේදී ලබාගත හැකි වාසිදායක තත්ත්ව ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ 05 කට පෙර සිටම කුබෝටා මිනි ට්‍රැක්ටර වේලරය අබලන් තත්ත්වයේ පවතින බැවින් භාවිතයෙන් ඉවත් කර තිබුණද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුතුමන්ගේ පූර්ණ අධීක්ෂණය මත ඉදිරි භාණ්ඩ සමීක්ෂණ කමිටුව මඟින් අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | -එම- |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019.01.10 දිනැති අංක 2019/01 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව දේපල වාර්ෂිකව බදු දීමේ දී ප්‍රසම්පාදන දැන්වීමක් පලකර බදු දීමට කටයුතු කල යුතු වුවත්, 2022 වර්ෂය සඳහා සතිපොළ ආපනශාලා කඩ කාමර අංක 1,2,3 බදුදීමේ දී එලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව 2019 වර්ෂයේ සිට එකම පුද්ගලයන් 3 දෙනෙකුට රු.1,500 බැගින් ගිවිසුම් අළුත් කරමින් බදු දී තිබුණි. | මෙම ආපනශාලා තුන සඳහා රු.1,500 මාසික බදු මුදලට 10% ක් එකතු කර කුලී ලබාගැනීම සිදු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර කඩ බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු අංක 36 තැබෑරුම් ගොඩනැගිල්ල වාර්ෂිකව බදුදීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව වාර්ෂිකව සභාව විසින් ලබාදෙනු ලබන ලිඛිත ලියවිල්ලක් මත දීර්ඝ කාලයක් තිස්සේ එකම | සභාව සතු තැබෑරුම් ගොඩනැගිල්ල ව්‍යාපාරික කටයුත්තක් සඳහා දීර්ඝකාලීනව එක් පාර්ශවයකට ලබාදීම | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව ගොඩනැගිල්ල බදු දීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පාර්ශවයකට මාසිකව රු.26,000 ක මුදලකට බදු දීමට කටයුතු කර තිබූ අතර එම ආයතනය සමඟ සභාව විසින් ගිවිසුමකට එළඹ නොතිබුණි. | සභාව විසින් සිදු කර ඇත. එබැවින් අදාළ ආයතනය සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. | |

## 04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් ගලි ප්‍රතිකර්ම මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.5,149,260 ක මුදලක් වැයකර තිබුණි. නිසි ප්‍රමිතියෙන් ඉදිකර නොමැති මෙම පද්ධතියට ප්‍රදේශයේ ගලි බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශය ඉතාම අපිරිසිදු හා දුර්ගන්ධයක් ඇති බව විගණනයට නිරීක්ෂණය විය. පද්ධතිය නිසි ප්‍රමිතියෙන් නොවුවද 2021 හා 2022 වර්ෂයේ ඔක්තෝම්බර් දක්වා ගලිරථ 571 ක් බැහැර කිරීමට කටයුතු කර තිබුණි. | මෙම පද්ධතිය ඉදිකිරීම සඳහා ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය මඟින් ලබාදී ඇති සැලසුම් හා පිරිවිතර භාවිතා කරන ලදි. එනමුත් මෙම පද්ධතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවේ. | පරිසරය ආරක්ෂා වන පරිදි ගලි බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |